ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පශ්චාත් කොවිඩ් ආර්ථික පුනර්ජීවනය පිළිබඳ වීඩියෝ සමුළුවක් ඉන්දීය ප්‍රධාන විධායක නිලධාරී සංසදයේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පවත්වයි**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශ ප්‍රධානී සුජා කේ. මෙනන් මහත්මිය ඊයේ දින (2020 මැයි 12) ශ්‍රී ලංකාවේ ඉන්දීය ප්‍රධාන විධායක නිලධාරි සංසදයේ (ICF) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සමඟ වීඩියෝ සමුළුවක් ඔස්සේ සම්බන්ධ විය.

2. ICF අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කොවිඩ් 19 වසංගත තත්වයෙන් මතුවන අභියෝග පිළිබඳවද වේගවත් ආර්ථික පුනර්ජීවනයක් සඳහා රජය සහ කර්මාන්ත අතර සාමූහික ප්‍රයත්නයන්ගේ වැදගත්කම පිළිබඳවද මෙහිදී අදහස් දැක්වීය. එසේම මෙහිදී එක් එක් සමාගම් තම ක්ෂේත්‍රය මුහුණ දී ඇති අභියෝග පිළිබඳවද කරුණු දැක්වීය. කෙසේ වෙතත්, ඔවුන් කොවිඩ් 19 අර්බුදය හමුවේ පවා පවතින අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් අනාගතය පිළිබඳ සුබවාදී හැඟීමක් පළ කළෝය.

3. සුජා කේ. මෙනන් මහත්මිය ICF සාමාජිකයන් විසින් ශ්‍රී ලංකා ආර්ථික පුනර්ජීවනය පිළිබඳ විශ්වාසය පළ කරමින් සිදු කළ සුබවාදී අදහස් දැක්වීම් අගය කළාය . ඉන්දියාව ශ්‍රී ලංකාව සමඟ සංවර්ධන හවුල්කාරිත්වයද සමීප ආර්ථික සහ වාණිජ සහයෝගීතාවයද තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බව ඇය ප්‍රකාශ කළාය . ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 වසංගතයට එරෙහි සටන සඳහා සහයෝගයක් වශයෙන්

ඉන්දියාව මෑතකදී ඖෂධ සහ වෛද්‍ය උපකරණ තොග හතරක් පරිත්‍යාග කරන ලද බව පැවසූ ඇය සඳහන් කළේ විවිධ අර්බුද සමයන්හිදී ශ්‍රී ලංකාවට උපකාර කරන පළමු රාජ්‍යයක් වශයෙන් ඉන්දියාව සිය කාර්යභාරය ඉටු කරන බවයි. දේශීය රැකියා ජනනය කරමින්, ආයෝජන සිදු කරමින් සහ කුසලතා සහ තාක්ෂණය ලබා දෙමින් ICF විසින් ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමට ලබා දෙන දායකත්වය ඇය අගය කළාය. එසේම, විශේෂයෙන්ම ආර්ථික සහ වාණිජ ක්ෂේත්‍රයන්හි ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා සඳහා ICF විසින් ලබා දෙන දායකත්වය පිළිබඳවද ඇය සිය ප්‍රසාදය පළ කළාය.

*****

කොළඹ

2020 මැයි 13